**WEB NOTICE**

**ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි නිපුණ ඉදිකිරීම් ශ්‍රමිකයන් සඳහා හැඳුනුම්පත් මුද්‍රණය කර සැපයීම සඳහා මිල යෝජනා කැඳවීම**

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි නිපුණ ඉදිකිරීම් ශ්‍රමිකයන් වෙත නිකුත් කිරීම සඳහා හැඳුනුම්පත් මුද්‍රණය කර සැපයීම වෙනුවෙන් **ඉදිරි වර්ෂයක කාලයක්** සඳහා යෝග්‍ය ආයතනයක් තෝරා ගැනීමට මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.
2022 වර්ෂයේදී හැඳුනුම්පත් 4000ක් පමණ මුද්‍රණය කර ගැනීමට අපේක්ෂා කරන අතර මුද්‍රිත හැඳුනුම්පත් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, "සව්සිරිපාය" 123, විජේරාම මාවත, කොළඹ 07 යන ලිපිනයට ගෙනවිත් භාරදීම සැපයුම්කරුවන් විසින් සිදු කල යුතුය.
පහත සඳහන් පිරිවිතරයන් යටතේ මුද්‍රණය කර සැපයිය යුතු අතර ඒ සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීම සිදු කල යුතුය.

i ප්‍රමාණය - දිග 8.5 cm පළල 5.5 cm 800 microns
ii වර්ගය - PVC plastic with Laminate
iii වර්ණ මුද්‍රණය
iv QR code මුද්‍රණය - හැඳුනුම්පතේ සඳහන් කර ඇති ශිල්පියාගේ තොරතුරු ( Name , NIC No. , Address, Trade, Grade, CIDA Registration Number) ඇතුලත්ව මුද්‍රණය කල යුතුය.
v ශිල්පියාගේ ඡායාරූපය
vi හැඳුනුම්පතෙහි මෘදු පිටපත අප විසින් ලබා දෙනු ලැබේ.
vii හැඳුනුම්පත සඳහා අවශ්‍ය ශිල්පියාගේ විස්තර email මගින් සපයනු ලැබේ.
viii හැඳුනුම්පත් ආකාර 4 කි.

සම්පූර්ණ කරන ලද ලංසු ලියවිලි 2022.05.09 දින ප.ව. 2.00 ට පෙර සභාපති, ප්‍රසම්පාදන කමිටුව , ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, "සව්සිරිපාය" 123, විජේරාම මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ පාලන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කල යුතුවේ.
ලංසු ලියවිලි විවෘත කිරීම 2022.05.09 දින ප.ව. 2.00 ට සිදු කරන අතර එම අවස්ථාව සඳහා ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගී විය හැකිය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සභාපති,
ප්‍රසම්පාදන කමිටුව,
ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය,
"සව්සිරිපාය" 123,
විජේරාම මාවත,
කොළඹ 07.